**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**අධ්‍යාපන පීඨය**

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පූර්ණ කාලීන - 2021/2022

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (නාට්‍ය හා රංග කලාව) පූර්ණ කාලීන - 2021/2022

**PBE 803 -අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**

**කාලය පැය 02 යි**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

(1) i. මනෝවිද්‍යාව නිර්වචනය කර, අධ්‍යාපන මනෝවිද්‍යාවට අදාළ විෂය ක්ෂේත්‍රය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

ii. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා වෘත්තීය ගුරුවරයකු ලෙස ඔබ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම යොදා ගන්නා ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න (ලකුණු 13)

(2) i. ළමා වර්ධනය සහ සංවර්ධනය අතර වෙනස පැහැදිලි කර, ළමා සංවර්ධන මූලධර්ම 04 ක් විස්තර කරන්න. (ලකුණු 12)

ii. ළමා සංවර්ධනයේ ප්‍රධාන මාන තුන නම්කර, එකී මානයන්ට අනුව නවයොවුන් වියේ දරුවාගේ සංවර්ධනය සිදුවන ආකාරය සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 13)

(3) i. ජීන් පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායට අනුව සංයුක්ත සහ වියුක්ත ක්‍රියාකාරී චින්තන අවධිවල ලක්ෂණ සඳහන් කරන්න.

(ලකුණු 12)

ii. මානව 'පෙළඹවීම' කෙටියෙන් හඳුන්වා, මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රායෝගික කළහැකි ආකාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 13)

(4) i. 'පෞරුෂය ' යන්න හඳුන්වා, පුද්ගල පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක 05ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

ii. සමබර පෞරුෂයකින් යුතු සිසු පරපුරක් නිර්මාණය කිරීමේ ගුරු කාර්යය සඵල කරගැනීමට වෘත්තීය ගුරුවරයකුට පෞරුෂ සංවර්ධන න්‍යායන් පිළිබඳ අවබෝධය කොතෙක් දුරට ඉවහල් කරගත හැකිද? සුදුසු උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 13)

(5) i. 'ඉගෙනුම' අර්ථ දක්වා, ඉගෙනුම පිළිබඳ චර්යාවාදී මතය හා ප්‍රජානන මතය අතර වෙනස ඊට අයත් මූලික සංකල්ප ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. 'ඉගෙනුම් මාරුව' යන්න අර්ථ දක්වා, වඩාත් සාර්ථක ඉගෙනුම් මාරුවකට තුඩුදෙන පරිදි ඉගැන්වීමට ගුරුවරයකුට අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග පහක් (05) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 13)

(6) i. මානව මතක ක්‍රියාවලිය (Memory process) විස්තර කර මින් තොරතුරු අමතකවීමට බලපාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 12)

ii. 'අන්තර්කරණ අධ්‍යාපනය යනු විශේෂිත ළමුන් සාමාන්‍ය පන්තිකාමරයට යොමු කර ඉගැන්වීමයි' වෘත්තීය ගුරුවරයකු ලෙස මෙම සංකල්පය අවබෝධ කර ගැනීමේ වැදගත්කම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 13)

---------------------